## වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 05 දරණ
## වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය

(වයඹ ආණ්ඩුකාරවරයා අනුමැතිය දුන් දිනය : 1996.05.19)

වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව නමින් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් සංස්ථාපනය කිරීමට සහ වයඹ පළාතේ සමුපකාර සමිති වල සේවකයින් සම්බන්ධයෙන් හා ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතට අනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඩු නාමය. 01. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 05 දරන වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ක්‍රියාත්මක වන දිනය. 02. අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කොට ප්‍රසිද්ධ කරනු ලබන නියමයක් මගින් එකී නියමයේ සඳහන් නිශ්චිත දිනයක සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේ ය.

## I කොටස

## වයඹ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව සංස්ථාපනය, එහි බලතල හා කාර්යයන්

වයඹ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව. සංස්ථාපනය.

03. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා මින් මතුවට කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන වයඹ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවනු ලැබේ.

නීතිගත සංස්ථාවක් විය යුතු බව.

04. කොමිෂන් සභාව අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත සංස්ථාවක් විය යුතු අතර, එහි නෛතික සංස්ථාගත තත්ත්වයෙන් නඩු හෝ නීති කෘත්‍ය ඉදිරිපත් කිරීමට සහ නඩු හා වෙනත් නීති කෘත්‍ය සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද, මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය සියළු දේ කිරීමට ද බලය ඇති නීතිගත සංස්ථාවක් බවට පත් වන්නේ ය.

කොමිෂන් සභාවේ සංයුතිය.

05. (1) කොමිෂන් සභාව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(2) යම් තැනැත්තකු :

(අ) සමූපකාර සමිති සේවකයෙකුගේ හිටපු සේවකයෙකු වේ නම් හෝ,

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව සමූපකාර සේවකයින්ගේ වැටුප්, වේතන හෝ සේවා කොන්දේසි සකස් කිරීමේ අරමුණ වශයෙන් පවත්වාගෙන යනු ලබන සේවක වෘත්තීය සමිතියක සාමාජිකයෙකුව සිටින තැනැත්තෙකු වේ නම් හෝ,

(ඇ) සමූපකාර සමිති නීතිය අනුව සමූපකාර සමිතියක නිලධාරියෙකු වන යම් තැනැත්තෙකු වේ නම් හෝ,

(ඇ) සිහි විකල් තැනැත්තෙකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තෙකු හෝ දණ්ඩ නීති සංග්‍රහය යටතේ නැතහොත් අල්ලස් පනත යටතේ වරදකරුවෙකු බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබ සිටින පුද්ගලයෙකු වේ නම් හෝ,

(ඉ) තත් කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ යම් පළාත්පාලන ආයතනයක සභිකයෙකු හෝ වශයෙන් ධුර දරන තැනැත්තෙකු වේ නම් හෝ,

ඒ තැනැත්තා එකී කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ කටයුතු කිරීමට හෝ නුසුදුස්සකු විය යුතුය.

සාමාජිකයින්ගේ ධුර කාලය.

06. අමාත්‍යවරයා විසින් ඉවත් නොකළහොත් හෝ මෙම ප්‍රඥප්තියේ 5(2) වගන්තිය අනුව නුසුදුස්සකු නොවුනහොත් හෝ සෑම සාමාජිකයකුම පත් කරනු ලැබූ දින සිට තුන් වසරක කාලයක් ස්වකීය ධුරය දැරිය හැකිය.

යම් සාමාජිකයෙකු ස්වකීය ධුරයෙන් ඉවත් කරනු ලැබීම හෝ ඉල්ලා අස්වීම හෝ මරණය හේතු කොට ගෙන හෝ ඇතිවන පුරප්පාඩුවක් සඳහා පත් කරනු ලැබූ තැනැත්තකුගේ ධුර කාලය අන්‍ය නියමයක් නොකළහොත් ඒ අනෙක් සාමාජිකයන්ගේ ධුර කාලය අවසන් වන දිනයෙන් අවසන් වේ.

සභාපති හා කොමිෂන් සභාවේ කටයුතු පවත්වාගෙන යාම.

07. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් එක් අයකු එහි සභාපතිවරයා වශයෙන් නම් කළ යුතුය. සභාපතිවරයා පැමිණ සිටින සෑම අවස්ථාවකදීම ඔහු කොමිෂන් සභා රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. සභාපතිවරයා නොපැමිණි විටදී පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් තෝරා ගනු ලබන එක් අයකු විසින් රැස්වීමේ මුලසුන ගත හැකිය.

04 ( ...

(2) කොමිෂන් සභා රැස්වීම් වල ගණපූර්ණය සඳහා එහි සාමාජිකයන් දෙදෙනෙකු පැමිණ සිටීම ප්‍රමාණවත් වේ.

(3) සාමාජිකයන් දෙදෙනෙකු පමණක් පැමිණ සිටින අවස්ථාවකදී යම් කරුණක් පිළිබඳව තීරණයක් ගත නොහැකි වූ විටක ඒ කරුණ කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනාම පැමිණ සිටින රැස්වීමකට ඉදිරිපත් කළ යුතුය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනාම පැමිණ සිටින රැස්වීමකදී යම් කරුණක් පිළිබඳව ගත යුතු තීරණය සම්බන්ධයෙන් ඒ සාමාජිකයන් අතර, ව[illegible] මතය වෙනස් වන්නේ නම් වැඩි දෙනාගේ මතයට අනුව තීරණයකට එළඹිය යුතුය. එහෙත් සාමාජිකයින් සමානව බෙදුනහොත් සභාපති වරයාට තීරක ඡන්දයක් හිමිවේ.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීම නිසා හෝ පත් කිරීම සම්බන්ධයෙන් වන අඩුපාඩුවක් නිසා හෝ ඒ කරුණ හේතු කොට ගෙන කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ හෝ කරනු ලබන නියෝග හෝ විධිවිධාන කිසිවක් නිර්බල නොවන්නේ ය. නැතහොත් නිර්බල වන්නාසේ නොසැලකිය යුත්තේ ය.

(6) ස්වකීය කාර්ය පරිපාටි සකස් කර ගැනීම පිළිබඳ ඉහත සඳහන් කරුණු වලින් ආවරණය නොවන්නා වූ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවශ්‍ය වන විධිවිධාන සකස් කර ගැනීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවීම.

08. වයඹ පළාතේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාවේ සභාපතිට සහ එහි සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික සහ දීමනා අමාත්‍යවරයා විසින් නියම කළයුතු වන්නේ ය.

**ලේකම් සහ අනෙ‍ක් නිලධාරීන්.**

09\. (1) කොමිෂන් සභාවට ලේකම්වරයකු සිටිය යුතු අතර, ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු විය යුතුය.

(2) කොමිෂන් සභාවේ සෙසු කාර්ය මණ්ඩලය පළාත් රාජ්‍ය සේවකයින් අතුරෙන් පත් කරගත යුතුය. මෙම සේවකයින් පළාත් රාජ්‍ය සේවයේ අදාළ පරිපාලන හා විනය නියමයන්ට යටත්වේ.

**කොමිෂන් සභාවේ සහ නිලධාරීන්ගේ නිල දිවුරුම.**

10\. (1) කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයින් ලෙස පත් කරනු ලැබූ තැනැත්තන් විසින් ස්වකීය ධුරයේ කාර්යයන් ආරම්භ කිරීමට මත්තෙන් මෙම ප්‍රඥප්තියේ සඳහන් උපලේඛන අංක 1 ප්‍රකාර දිවුරුම් / ප්‍රතිඥා දිය යුතුය.

(2) ලේකම් හා කාර්ය මණ්ඩලයේ සෙසු නිලධාරීන් කොමිෂන් සභාවේ සභාපතිවරයා ඉදිරියේ දී මෙම ප්‍රඥප්තියේ සඳහන් උපලේඛන අංක 2 ප්‍රකාර දිවුරුම් / ප්‍රතිඥා දිය යුතුය.

**කොමිෂන් සභාවේ බලතල.**

11\. (1) කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතුය.

(අ) සමුපකාර සමිතිවල සියළු සේවකයින් බඳවා ගැනීම හා උසස් කිරීමට අදාළ සේවා කොන්දේසි හා මූලධර්ම ඇතුළත් කාර්ය පටිපාටි නියම කිරීම.

(ආ) අවශ්‍ය විටක සමුපකා ර සමිති සේවකයින් බඳවා ගැනීමට අදාළ විභාග පැවැත්වීම, හා එබඳු විභාග පැවැත්වීමේ මණ්ඩල නම් කිරීම හා එබඳු විභාග සඳහා වන ගාස්තු නියම කිරීම.

06 / ...

(ඇ) සමුපකාර සමිතියක සෑම තනතුරකට පත් කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම් නියම කිරීම, සෑම පන්තියක හෝ ශ්‍රේණියක තනතුරකට හෝ තනතුරු වලට අදාළ වැටුප් ක්‍රම නියම කිරීම, කලින් කලට එසේ නියම කළ වැටුප් ක්‍රම සංශෝධනය කිරීම, එමෙන්ම කොමසාරිස්වරයා විමසා එබඳු කරුණු පිළිබඳව තීරණය කිරීම.

(ඈ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන වැටුප් ක්‍රම අනුව වැටුප් ගෙවන ලෙසට සමුපකාර සමිතිවලට නියම කිරීම.

(ඉ) සමුපකාර සමිති විසින් සිය සේවකයන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටි නිශ්චය කිරීම, ඒවා පැවැත්වීම සඳහා බලතල නියම කිරීම හා නියම කරනු ලබන කාල සීමාවක් ඇතුළතදී විනය පරීක්ෂණයක් පවත්වා අවසන් කරන ලෙස සමිතිවලට දැනුම් දීම.

(ඊ) සෑම සමුපකාර සමිතියක් විසින් ගනු ලබන විනයානුකූල නියමයන් හේතු කොට ගෙන පැන නගින අභියාචනා විභාග කිරීම.

(එ) සිය සේවකයින් පිළිබඳව සමුපකාර සමිති විසින් තබාගත යුතු වාර්තා කවරේදැයි නියම කිරීම.

(ඒ) සෑම සේවකයෙකු පිළිබඳව කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි පිටපත්, වෙනත් ලේඛණ හා විස්තර වාර්තා නියමිත දිනකට කලින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස සහ සපයන ලෙස සෑම සමිතියකට නියම කිරීම.

(ඔ) කොමිෂන් සභාව විසින් යොමු කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා නිර්දේශ සහිතව කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට අභියාචනා පරීක්ෂක නිලධාරී හෝ නිලධාරී මණ්ඩල පත් කිරීම.

(ඕ) තමාගේ ක්‍රියා කලාපය විනය පරීක්ෂණයක විෂය කාරණයක්ව පවතින යම් සමිතියක ඕනෑම සේවකයෙකු විසින් එම සමිතිය දුන් විනය නියෝගයකට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනා කොට ඇති අවස්ථාවක එවැනි අභියාචනයක් සලකා බලා සමිතිය විසින් කරන ලද තීරණය වෙනස් කිරීමට, ලිහිල් කිරීමට, අවලංගු කිරීමට හෝ ඒ වෙනුවට වෙනත් තීරණයක් ගැනීමට හෝ නැවත පරීක්ෂණයක් පවත්වන ලෙස නියෝග කිරීමට හෝ එවැනි සේවකයෙකු නැවත සේවයට ගැනීම ඇතුළුව කොමිෂන් සභාව විසින් දෙනු ලබන නියෝග හා ඒවායේ සඳහන් වන ආකාරයට හා දිනකදී නැතහොත් නියම කරනු ලබන දිනකට පූර්වයෙන් ක්‍රියාත්මක කරන ලෙසට සමූපකාර සමිතියකට නියෝග කිරීම.

(ක) විනය කාරියයක් නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ සේවකයෙකුගේ සේවය අවසන් කිරීමකදී අවශ්‍ය වන්නේ නම් පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ සේවකයින්ට ලබාදීම පිළිබඳව ප්‍රතිපත්ති තීරණය කිරීම.

(කා) අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි මගින් නියම කරනු ලබන යම් මුදලක් තැන්පත් කරන ලෙස අභියාචනාකරුට නියම කිරීමට සහ අභියාචනා පරීක්ෂණය අවසානයේ දී එකී තැන්පත් මුදල රඳවා ගැනීමට හෝ ආපසු ගෙවීමට තීරණය කිරීම.

(2) (1) වැනි උප වගන්තියේ (ඊ) (ඕ) සහ (කා) යන ඡේදවල විධිවිධාන හැර අනෙකුත් ඡේදවලින් කොමිෂන් සභාව වෙත පැවරෙන බලතල ක්‍රියාවෙහි යෙදීමේ දී කොමිෂන් සභාව විසින්, කරන ලද යම් තීරණ හෝ නියෝග කිරීම් වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට කොමිෂන් සභාවට කළ හැකිය.

08 (...

**මූල්‍ය ප්‍රතිපාදන**

12. සමූපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන පළාත් සභාව විසින් වාර්ෂිකව වෙන්කර දිය යුතුය.

**අරමුදලක් පිහිටුවීම.**

13. අභියාචනාකරුවන්ගේ තැන්පත් මුදලින් අරමුදලක් පිහිටුවිය හැකිය. මෙහි අරමුදලට ඉහත 11 (1) (ක) වගන්තියේ සඳහන් තැන්පත් මුදල් බැර කළ හැකිය. මෙම අරමුදලේ කළමනාකාරිත්වය කොමිෂන් සභාව සතුය.

## II - කොටස

## සමූපකාර සමිති හා ඒවායේ කාර්ය මණ්ඩලය

**සමූපකාර සමිතියක් සේවා යෝජකයෙකු විය යුතු බව.**

14. යම් සේවකයෙකු වෙනුවෙන් වැටුප් හෝ වෙනත් පඩිනඩි ගෙවනු ලබන සමූපකාර සමිතියක් එම සේවකයාගේ සේවා යෝජකයා ලෙස සළකනු ලැබිය යුතුය.

**සමූපකාර සමිති සේවකයින්ගේ වැටුප්.**

15. සෑම සමූපකාර සමිතියක්ම එහි අරමුදලින් එම සමිතියේ සේවකයින්ගේ වැටුප් හා අනිකුත් දීමනා ගෙවිය යුතුය.

**සමූපකාර සමිති සහ ඒවායේ සේවකයන් කොමිෂන් සභාවේ නියෝගයන්ට යටත් විය යුතු බව.**

16. ඕනෑම සමූපකාර සමිතියක් හා ඒ සමිතියේ කවර සේවකයකු වුවද මෙම ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි නියෝගයන්ට යටත් විය යුතු අතර, මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාවේ බලතල ඉටුකිරීමෙහි හා ක්‍රියාවෙහි යෙදවීමේහි ලා කෙරෙන කොමිෂන් සභාවේ සියළු නියෝගයන් හා 11 (2) වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව කරනු ලබන නියමයන් අවසානාත්මක විය යුතු අතර, එකී සමූපකාර සමිති හා ඒවායේ සේවකයන් ඒ නියමයන් පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

09 ද ...

**කොමිෂන් සභාවේ නියෝග වලින් සමුපකාර සේවකයින් බැඳෙන බව.**

17. යම් සමුපකාර සමිතියක යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරනු ලබන සියළු නියෝග 11(2) වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව අවසානාත්මක විය යුතු අතර, ඒ නියෝග සමිතිය විසින් කරන ලද්දක් පරිද්දෙන් ඒ සේවකයා විසින් පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

**වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය නිසා ඇතිවන වෙනස්කම්.**

18. මෙම ප්‍රඥප්තිය යටතේ වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවන දිනට හෝ ඊට පූර්වයෙන් 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත මගින් ප්‍රතිස්ථාපිත සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් මෙන්ම, වයඹ පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ ප්‍රතිෂ්ඨාපිත වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ද, වයඹ පළාත් සමුපකාර සමිති හා සේවකයින් විෂයෙහි ක්‍රියාත්මක වන පරිදි,

(අ) නිශ්චය කරන ලද වැටුප් ක්‍රම හා සේවා කොන්දේසි ඇතුළු සියළු වර්ග කිරීම්,

(ආ) එම පනතේ කාර්යයන් ඉටුකිරීමෙහි ලා නිකුත් කරන ලද සියළු ආකාරයේ විධානයන්,

(ඇ) භාරගන්නා ලද සියළුම ආකාරයේ අභියාචන විභාග කිරීමට ආරම්භ කරන ලද හා විභාග නිමකොට නියෝග නිකුත් කිරීමට අදාළ සියළු අභියාචනා,

(ඈ) ආරම්භ කරන ලද සියළුම ආකාරයේ නීති කෘත්‍යයන්,

(ඉ) පනවන ලද සියළු රෙගුලාසි සහ නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධානයන් සහ

(ඊ) කරන ලද සියළුම පත්කිරීම් හා උසස් කිරීම්,

මෙම ප්‍රඥප්තිය යටතේ සිදු කරනු ලැබූ පරිද්දෙන් නීතිමය බලය සහිතව වලංගුව බලපැවැත්විය යුතුය.

10 වි...

**පදිංචිය පිළිබඳ සුදුසුකම්.**

19. සමුපකාර සමිතියක ඕනෑම තනතුරක් සඳහා බඳවා ගත හැක්කේ වයඹ පළාත ඇතුළත ස්ථිර පදිංචියක් ඇති තැනැත්තෙකු පමණි. එසේ වුවද, කොමිෂන් සභාවේ මතය අනුව යම් සමුපකාර සමිතියක එවැනි තනතුරක් සඳහා සුදුසුකම් ඇති අයෙකු වයඹ පළාත ඇතුළතින් තෝරා ගැනීමට අපහසු වුවහොත්, අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසිවල සඳහන් නියමයන්ට යටත්ව සමිතිය විසින් එකී කොමිෂන් සභාවට දැන්වීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ අනුමතිය මත එම පළාත තුළ ස්ථිර පදිංචියක් නොමැති වුවද සුදුසුකම් ඇති අයෙකු පත්කර ගැනීමට සමුපකාර සමිතියකට බලය තිබිය යුතුය.

**සමුපකාර සමිතියක වර්ගය අනුව සහ සේවකයින්ගේ වර්ගය හා පන්තිය අනුව සේවක වැටුප් ක්‍රම නිශ්චය කළ යුතු බව.**

20. සමුපකාර සමිතියක යම් තනතුරකට පත් කරනු ලබන ඕනෑම තැනැත්තකු එම තනතුරට අදාළ වූ වැටුප් ක්‍රමයක පිහිටුවිය යුතුය. එය 25(1) වගන්තියේ සඳහන් ආකාරයට සමිතියේ වර්ගයට අනුව නිශ්චය කරනු ලබන සේවක වර්ගයට සහ පන්තියට අදාළ වන පරිදි තීරණය විය යුතුය.

**වයඹ පළාත් රාජ්‍ය සේවයෙන් ද්විතීයනය කිරීම.**

21. මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවල කුමක් සඳහන් වුවද පත් කිරීමේ බලධරයාගේ එකඟත්වය සහ අදාළ නිලධාරියාගේද, සමිතියේ ද කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවයෙන් ද්විතීයනය කරන ලද නිලධාරියෙකු සමිතියක යම් තනතුරකට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවකට නියමයන්ට හා කොන්දේසි වලට යටත්ව පත් කිරීමට කොමිෂන් සභාවට හැකිය.

මෙම වගන්තියේ කාර්යයන් සඳහා පත් කිරීමේ බලධාරියා යනුවෙන් අදහස් කරනුයේ පළාත් රාජ්‍ය සේවයේ පත් කිරීමේ බලධරයා වේ.

සමූපකාර සේවකයින් සේවයෙන් පහ කිරීම සහ අඩුවම් කිරීම.

22. (1) සමූපකාර සමිතියක සේවකයකු සේවයෙන් පහ කිරීමට හෝ අන්‍යාකාරයක අඩුවමක් කිරීමට මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සැලකෙන හෝ රෙගුලාසිවලට අනුව මිස නොකළ යුතුය.

(2) මේ වගන්තියේ සඳහන් විධිවිධාන කිසිවකින් මෙම කොමිෂන් සභාව සංස්ථාපනය කිරීමේ දිනයට පෙර සිදුවූ තැනහොත් උද්ගතවූ යම් විෂමාචාරයක් හෝ විනය කඩ කිරීමක් හෝ වෙනත් පැමිණිලි නිමිත්තක් හෝ සම්බන්ධයෙන් යම් සමූපකාර සමිතියක සේවකයකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට, මේ විධිවිධාන අනුව පවත්වාගෙන යාමට හා අවසන් කිරීමට බාධාවක් ඇති නොවන්නේ ය.

(3) විධිමත් පරිදි විනයානුකූලව කටයුතු කිරීමකින් තොරව කිසියම් සේවකයෙකුට අඩුවම් නියම කිරීමට එරෙහිව එම සේවකයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයකදී හෝ ඊට සම්බන්ධව නිති කෘත්‍යයකදී සේවකයාට වන්දි, හිඟ වැටුප්, අඩ මුදල් හෝ වෙනත් මුදලක් සමිතියෙන් ගෙවීමට සිදුවුවහොත් ඊට වගකිව යුතු කාරක සභාවේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් විසින් තනි තනිව හා එකමුතුව එකී මුදල සමිතියට ප්‍රතිපූරණය කිරීමේ වගකීමට බැඳී සිටිය යුතුය.

සේවකයින්ට අදාළ රෙගුලාසි.

23. (1) පහත සඳහන් ආකාරයේ එනම්;

(අ) සමූපකාර සමිතිවල සේවකයින් වර්ග කිරීම් ශ්‍රේණි හා පන්ති නියම කිරීම්, බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, ඉල්ලා අස්වීම් සහ සේවය අවසන් කිරීම් පිළිබඳව.

(ආ) සේවකයින්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කරමින් හා සේවකයින්ට වැටුප් ක්‍රම, දීමනා හා පාරිතෝෂික ගෙවීම්, අත්තිකාරම් ප්‍රදානයන්, නිවාඩු, විනය ක්‍රියාවලිය හා අභියාචනා පිළිබඳව සහ

(ඇ) සේවා නියමයන් හා කොන්දේසි වලට අදාළ හා අවශ්‍ය වෙතැයි සැලකෙන වෙනත් කරුණු පිළිබඳව

අමාත්‍යවරයා විසින් රෙගුලාසි සාදනු ලැබිය හැකිය.

(2) වයඹ පළාත් සභා බලසීමාව තුළ පිහිටි සියළුම සමුපකාර සමිති සහ ඒවායේ සේවකයින් මෙහි (1) වන උප වගන්තියේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් පනවනු ලබන සෑම රෙගුලාසියකින්ම බැඳී සිටිය යුතුය.

**සිය සේවකයින් සම්බන්ධ සමුපකාර සමිතිවල කාර්යභාරයන්.**

24. (1) සෑම සමුපකාර සමිතියක් විසින් ම:

(අ) එහි සෑම සේවකයෙකු සම්බන්ධයෙන්ම කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ලේඛන හා වාර්තා තබාගත යුතු අතර එක් එක් සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ආකාරයට අදාළ අවශ්‍ය සියළුම විස්තර ඒවායේ ඇතුළත් කළ යුතුය.

(ආ) කොමිෂන් සභාව විසින් සේවකයින් පිළිබඳව සැපයිය යුතු යයි නියම කරනු ලැබිය හැකි වාර්තා හා තොරතුරු සහ විටින්විට කොමිෂන් සභාවට අවශ්‍ය වෙතැයි නියම කරනු ලැබිය හැකි ආකාරයට තොරතුරු සැපයිය යුතුය.

13 (...

(ඇ) ඒම සමිතියේ කාර්යාල වලින් යම් කාර්යාලයකට ඇතුළු වී එහි පවත්වාගෙන යනු ලබන පොත්පත් ගිණුම් වාර්තා සහ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට සහ ඒවායේ පිටපත් ලබා ගැනීමටද ඒ සඳහා බලය පවරනු ලැබූ කොමිෂන් සභාවේ සාමාජිකයකුට හෝ සේවකයෙකුට හෝ එසේ කිරීමට ඉඩදිය යුතුය.

## III - කොටස

## කොමසාරිස්වරයාගේ බලතල

කොමසාරිස්වරයා විසින් සමිති වර්ග කළයුතු බව හා කාර්ය මණ්ඩලය නිශ්චය කළයුතු බව.

25. (1) සමුපකාර සමිතිවල සේවක තනතුරු වෙනුවෙන් වැටුප් ක්‍රම නියම කිරීම සඳහා සමුපකාර සමිති වර්ග කිරීමටද, ඒ සමිතිවල සේවක වර්ග හා පන්ති සහ එක් එක් වර්ගයේ හා පන්තියේ සිටිය යුතු සේවකයින්ගේ සංඛ්‍යාව නියම කිරීම් හා අවශ්‍ය වෙතැයි තමා සලකන පරිදි විටින්විට වෙනස්කම් කිරීමේ බලය කොමසාරිස්වරයාට තිබිය යුතුය.

(2) ඉහත (1) වන උප වගන්තිය අනුව, කොමසාරිස්වරයා විසින් කරනු ලබන නියමයකට පටහැනි වන පරිදි කිසිම සමුපකාර සමිතියක් විසින් කිසිම තැනැත්තෙකු සේවයට බඳවා ගැනීම නොකළ යුතුය.

14 / ...

## IV - කොටස

## විවිධ කරුණු

දුෂ්කරතා ඉවත් කිරීම.

26. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී එමගින් විධිවිධාන සලස්වා නොමැති හෝ ක්‍රියාත්මක විධිවිධාන සලස්වා නොමැති හෝ කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් සැකයක් හෝ දුෂ්කරතාවයක් හෝ උද්ගත වුවහොත් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් ඒ දුෂ්කරතාවය හෝ සැකය ඉවත් කළ හැකිය. නැතහොත් තීරණයක් කළ හැකිය. එවැනි නියෝගයක් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව එට නීතිමය බලය තිබිය යුතු අතරම, මෙම ප්‍රඥප්තියෙහි ඇතුළත් කොට පනවනු ලැබුවාක් මෙන් වලංගුව හා බලාත්මකව පැවතිය යුතුය.

අමාත්‍යවරයා විසින් රෙගුලාසි පැනවිය හැකි බව.

27. (1) මෙම ප්‍රඥප්තියේ ඇතුළත් විධිවිධානයක් ක්‍රියාත්මක කිරීමට සහ එහි අන්තර්ගත ප්‍රතිපත්ති සාධනය කිරීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා අදහස් කරනු ලබන සියළුම කරුණු සම්බන්ධයෙන් රෙගුලාසි සෑදීමේ බලය අමාත්‍යවරයාට ඇත්තේ ය.

(2) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය පළ කරනු ලැබූ දින හෝ නියෝගයෙහි නිශ්චිත යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා වයඹ පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට, එහෙත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය. යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන ලද දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය

**කොමිෂන් සභාව සහ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ මුක්තිය.**

28. ගන්නා ලද තීරණයක් හෝ කරන ලද හෝ නොකරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාවේ සාමාජික තත්ත්වයෙන් ඒ තැනැත්තාට හෝ නීතිගත සංස්ථා තත්ත්වයෙන් කොමිෂන් සභාවට හෝ විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය.

**කොන්ත්‍රාත් හෝ දෛනික පඩි ගෙවීමේ පදනම මත සේවකයින් බඳවා ගැනීම.**

29. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වල කුමක් සඳහන් වුවද, යම් සමුපකාර සමිතියක් එහි කාර්යක්ෂමතාවය උදෙසා,

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව කොන්ත්‍රාත් පදනමින් නිශ්චිත සේවා කොන්දේසි වලට අනුකූලව ප්‍රවීනයකු හෝ විශේෂඥයකු සේවයට බඳවා ගත හැකිය.

නැතහොත් ;

(ආ) අනියම් හෝ දවස් පඩි හෝ පැය පඩි ගෙවන සේවකයින් හෝ කෑලි ක්‍රමයට ගෙවන සේවකයින් සේවයෙහි යොදවා ගත හැකිය.

එසේ වුවද කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව එවැනි සේවකයින්ට සේවා ස්ථිරත්වයක් ලබා නොදිය යුතුය.

**වැරදි.**

30. (1) (අ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝණය කරන හෝ

(ආ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් කාර්යයක් ඕනෑකමින් නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ මඟහැර හරින හෝ මෙම ප්‍රඥප්තියේ අවශ්‍යතාවයන්ට අනුව කොමිෂන් සභාවට හෝ යථා පරිදි බලය පවරනු ලැබූ අන්‍ය තැනැත්තකුට හෝ සපයන ලෙස නියම කරනු ලබන යම් තොරතුරක් සැපයීම ඕනෑකමින්ම නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ

(ඇ) අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරක් ඉදිරිපත් කරන හෝ

යම් සමූපකාර සමිතියක් හෝ කාරක සභාවක් හෝ යම් නිලධාරියකු හෝ යම් සේවකයකු හෝ මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතුය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් යම් වරදක් කරන සෑම සමූපකාර සමිතියක් හෝ සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(3) සමූපකාර සමිතියක් විසින් මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් කරනු ලැබූ විටක එම සමූපකාර සමිතියේ සෑම නිලධාරියකුම එම වරදට වරදකරුවකු විය යුතුය. තවද එම වරද සිදුකිරීම වැලැක්වීම පිණිස අවශ්‍ය සියළුම කාර්යයන් තමා කළ බවට හෝ එම වරද තමාගේ අනුදැනුමක් නොමැතිව සිදු කරන ලද බවට හෝ ඔහු විසින් ඔප්පු කරතොත් මිස ඒ වරදකරු බවට සළකනු ලැබිය යුතුය.

(4) යම් සේවකයකු නැවත සේවයේ පිහිටුවන ලෙස හෝ එබඳු ඕනෑම නියෝගයක් හෝ කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ විට එවැනි නියමයන්ට අනුව කටයුතු කිරීම පැහැර හැරීම හේතු කොටගෙන යම් සමූපකා ර සමිතියක් වරදකරු කරනු ලැබූ විටක එවැනි සමූපකාර සමිතියක්,

(1) (2) වන උප වගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි අඩුවමකට - අතිරේකව ඒ වරද කරනු ලැබීමෙන් පසු ඒ පැහැර හැරීම ඉදිරියටත් පත්වාගෙන යන එක් එක් දිනයක් පාසා එක් එක් දිනය වෙනුවෙන් රුපියල් දෙසිය පණහක් (රු: 250/-) බැගින් වූ දඩ මුදලක් ගෙවීටම ද යටත් වන අතර,

(II) කොමිෂන් සභාවේ නියමකට අනුකූලව එසේ සේවකයා නැවත සේවයෙහි පිහිටුවිය යුතු දින සිට අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වන දින දක්වා කාලයට ඒ සේවකයාගේ සේවය අවසන් නොකොට දිගටම සේවයෙහි රඳවා සිටියේ යැයි සලකා ඔහුට හිමිවිය යුතු වන වැටුප් හා වෙනත් දීමනා සියල්ල ගෙවීමට ද බැඳී සිටිය යුතුය.

(III) යම් සේවකයෙකුට වැටුපක් හෝ අන්‍යාකාරයක දීමනාවක් හෝ වන්දියක් හෝ ගෙවන ලෙස කොමිෂන් සභාව නියම කරනු ලැබ ඇති විටක එම ගෙවීම පැහැර හරින ලද යම් සමිතියක් වරදකරු කරනු ලැබූ විට ඉහත (2) වන උප වගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි දඩුවමකට අතිරේකව කොමිෂන් සභාව නියම කොට ඇති මුදලද ගෙවීමට බැඳී සිටිය යුතුය.

මෙම උප වගන්තියේ II හා III වන ඡේද යටතේ සමූපකාර සමිතිය ගෙවීමට යටත් වන මුදල ඒ සමිතිය වරදකරු කරනු ලැබූ උසාවිය විසින් පනවනු ලබන දඩයක ස්වරූපයෙන් එම උසාවියේ අණයාවක් අනුව අයකරනු ලැබිය හැකිය. ඒ අය කරන මුදල සේවකයාට ගෙවිය යුතුය.

(5) මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යයකදී කොමිෂන් සභාවේ තීරණයක නැතහොත් නියෝගයක නිවැරදිභාවය සලකා බැලීමට පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳව තීරණය කිරීමට යම් මහේස්ත්‍රාත්වරයකුට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය. නැතහොත් නියම නොවිය යුතුය.

කොමිෂන් සභාවට බලපෑම් කිරීම.

31. ස්වකීය රාජකාරි ඉටු කිරීමේදී හැර සෘජුව හෝ වක්‍රාකාරයෙන් හෝ අන් තැනැත්තෙකුගේ මාර්ගයෙන් හෝ කවර ආකාරයකින් හෝ කොමිෂන් සභාවේ යම් තීරණයක් කෙරෙහි යම්කිසි සාමාජිකයෙකුට යම් බලපෑමක් කරනු ලබන හෝ කිරීමට තැත් කරන හෝ සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයක් හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක සිර දඬුවමකට හෝ යන දඬුවම් දෙකෙන් එකකට නැතහොත් එකී දඬුවම් දෙකටම යටත් කිරීමට හැකිය.

**අනුමැතියක් රහිතව තොරතුරු හෙළිදරව් කිරීම නොහැකි බව.**

32. කොමිෂන් සභාවේ සාමාජිකයකු, එහි ලේකම්, එහි කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ අන් කිසි තැනැත්තකු විසින් ස්වකීය නිල කාර්යයන් ඉටු කිරීමේ අවස්ථාවලදී හැර සිය රාජකාරි කටයුතු වලදී තමාට දැන ගන්නට ලැබෙන ලේඛනයක හෝ යම් සන්දේශනයක හෝ ඇතුළත් යම් තොරතුරක් අනාවරණය කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම නොකළ යුතුය.

**කොමිෂන් සභාවේ සන්දේශනයන් වරප්‍රසාද වලින් යුක්ත බව.**

33. කොමිෂන් සභාව හෝ එහි යම් සාමාජිකයකු හෝ නිලධාරියකු සහ යම් සමුපකාර සමිතියක් හෝ ඒ සමිතියේ කාරක සභාවේ සාමාජිකයකු හෝ නිලධාරියකු හෝ සාමාජිකයකු අතර කොමිෂන් සභාවේ නිල කාර්යයන් ඉටු කිරී ම සම්බන්ධයෙන් හුවමාරු වූ ලිඛිත හෝ වාචික සන්දේශනයක අන්තර්ගත යම් කරුණක් යම් නීති කෘත්‍යයකදී හෙළිදරව් කිරීමට හෝ ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවේ සභාපතිවරයා ලියවිල්ලකින් අනුමැතිය දී ඇතොත් විනා කිසිම තැනැත්තකුට අවසර නොතිබිය යුතුය.

**සමුපකාර සමිති සහ ඒවායේ සේවා නියුක්තයන් සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනත අදාළවීම.**

34. (1) කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරියක් වෙත යම් සේවා නියුක්තයකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් එම පනතේ 31 ආ වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් කොමිෂන් සභාව විසින් භාර නොගත යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ යම් සේවා නියුක්තකයකු විසින් කොමිෂන් සභාවට යම් කරුණක් සම්බන්ධයෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තයාට කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට බලයක් නොතිබිය යුතුය.

19 / ....

කොමිෂන් සභාවේ නිලධාරීන් රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

35. කොමිෂන් සභාවේ සභාපති හා සෑම සාමාජිකයකු ද, කොමිෂන් සභාවේ සෑම නිලධාරියකු හා සේවකයකුද දණ්ඩ නීති සංග්‍රහයේ පරමාර්ථය හා අර්ථය ඇතුළත රාජ්‍ය සේවකයකු වශයෙන් සැළකිය යුතුය.

අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛණ ගත ආයතනයක් විය යුතු බව.

36. අල්ලස් පනතේ පරමාර්ථය හා අර්ථය ඇතුළත කොමිෂන් සභාව එහි පනත යටතේ උපලේඛන ගත ආයතනයක් වශයෙන් සැලකිය යුතුය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

37. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අර්ථ නිරූපනය.

38. අදහස් සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි ;

"අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා ද,

"කාරක සභාව" යන්නෙන් ලියා පදිංචි කළ සමුපකාර සමිතියක කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය භාර කරනු ලැබූ ඒ සමිතියේ පාලක මණ්ඩල අදහස් වන අතර, ලියා පදිංචි කළ සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය හා කොමසාරිස්වරයා විසින් පත් කරන ලද තැනැත්තෙකු ඊට ඇතුළත් වේ.

"කොමසාරිස්" යන්නෙන් වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් ද,

"නිලධාරියා" යන්නෙන් යම් සමුපකාර සමිතියක් සම්බන්ධයෙන් සඳහන් කෙරෙන සෑම අවස්ථාවකදීම එම පදයෙන් සමුපකාර සමිතියක කාරක සභිකයින්, ලේකම්, විධායක නිලධාරීන් ද,

"සමුපකාර සමිතිය" යන්නෙන් සමුපකාර සමිති වලට අදාළ නීතිය යටතේ ලියාපදිංචි කරන ලද සමිතියක් ද,

"සේවකයා" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ අර්ථානුකූලව සමුපකාර සේවකයෙකු ද,

අදහස් කරනු ලැබේ.

<u>උප ලේඛන අංක - 01.</u>

**වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජිකයකු විසින් 10(1) වන වගන්තිය ප්‍රකාර දිවුරුම්දීම/ප්‍රතිඥාදීම.**

වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/ සාමාජික වශයෙන් පත් කරනු ලැබ සිටින ........................................ වන මම මා වෙත පැවරී ඇති වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික ධුරයට අයත් කාර්යයන් භයින් හෝ පක්ෂපාතීත්වයෙන් ද, දයාවෙන් ද හෝ ද්වේෂයෙන් ද, තොරව සම්පූර්ණයෙන් යුක්තිය හා සාධාරණය ඉටු කරන බවටත්, මගේ නිල කාර්යයන් ඉටු කිරීමේදී ඉහත ධුරයට අයත් කාර්යයන් සම්බන්ධයෙන් වූ කවර කරුණක් පිළිබඳව හෝ සෘජුව නැතහොත් වක්‍රාකාරයකින් හෝ කුමන පුද්ගලයකුට වුවද හෙළිදරව් නොකරන බවටත්, අවංකව ද, ගාම්භීර පූර්වකද ප්‍රකාශ කොට දිවුරුම් දෙමි/ ප්‍රතිඥා දෙමි.

.........................

අත්සන.

19 ............ ක්වූ ........... මස ...... දින දී මා ඉදිරිපිටදී දිවුරුම් දෙන ලදි./ ප්‍රතිඥා දෙන ලදි.

.........................

පළාත් මහාධිකරණ විනිශ්චයකාර.

උප ලේඛන අංක 02.

## වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරියකු විසින් 10(2) වගන්තිය ප්‍රකාර කරනු ලබන දිවුරුම/ප්‍රතිඥාව

වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරියකු වශයෙන් එකී ධුරයේ කාර්යයන් කිරීමට නියම කරනු ලැබ සිටින ...................... ..................... වන මම වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරී තනතුරට අයත් කාර්යයන් ඉටු කිරීමේ දී හැර අන් කවර විටකදී වුවත් එකී තනතුරේ කටයුතු කිරීමේදී මට දැන ගැනීමට ලැබෙන්නා වූ ලේඛනයක, සන්දේශයක හෝ තොරතුරක අන්තර්ගත කරුණු සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් හෝ සෘජුව නැතහොත් වක්‍රාකාරයකින් සැමත පුද්ගලයෙකුට වුවත් අනාවරණය නොකරන බවට අවංකවද, ගාම්භීර පූර්වකද ප්‍රකාශ කොට දිවුරුම් දෙමි / ප්‍රතිඥා දෙමි.

......................
(අත්සන)

19 ...... ක්වූ ............. මස ...... දිනදී මා ඉදිරිපිටදී දිවුරුම් දෙන ලදී/ ප්‍රතිඥා දෙන ලදී.

......................
(සභාපති)
වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව
කුරුණෑගල.

ඉ/-